{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
**Department of Education – North Central Province**

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 යි |
|---|---|---|

අමතර කියවීම් කාලය - මි. 10 යි

## නාට්‍ය හා රංග කලාව - I

| 57 | S | I |
|---|---|---|

ඇතුළත්වීමේ අංකය :- ......................................................................

උපදෙස් :

I කොටස - සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01. නාට්‍ය නම් වූ පංචම වේදය නිර්මාණය කිරීමේ දී මහබඹු විසින් "රසය" උකහා ගනු ලැබුයේ,
    1. ඍග් වේදයෙනි 2. යජුර් වේදයෙනි 3. සාම වේදයෙනි
    4. අථර්ව වේදයෙනි 5. ඍග් හා යජුර් වේදයන්ගෙනි (........)

02. නාට්‍ය ශාස්ත්‍රයට අනුව දිව්‍ය ලෝකයේ නිෂ්පාදනය කරන ලද ප්‍රථම නාට්‍ය වන්නේ කුමක් ද?
    1. මෘච්ඡකටිකය 2. අමෘතමන්ථනය 3. නාගානන්දය
    4. ප්‍රියදර්ශිකාය 5. මාලවිකාග්නිමිත්‍රය (........)

03. සංස්කෘත නාට්‍ය ගෘහයේ විකාශය අනුව නාට්‍ය මණ්ඩප ආකාර තුන නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?
    1. ජ්‍යෙෂ්ඨ, මධ්‍යම, අවර 2. බීජ, බිංදු, පතාකා 3. විකෘෂ්ට, චතුරස්‍ර, ත්‍ර්‍යස්‍ර
    4. මගධී, ප්‍රාච්‍යා, අවන්ති 5. උත්තම, මධ්‍යම, අධම (........)

04. නාට්‍ය ධර්මී ශෛලියේ ලක්ෂණ ඇතුළත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    1. ලෝකයේ සිදුවන යමක් වේදිකාව මත ඒ අයුරින්ම සිදු කිරීම.
    2. සැම විටම කාලීන තේමාවක් වස්තුකර ගැනීම.
    3. ඍජු අංගරචනය භාවිතයට ගැනීම.
    4. තත්වානුරූපී මායාව ඇති කිරීමට රංගභූමි අලංකරණ බහුලව යොදා ගනියි.
    5. එක් භූමිකාවක් රඟපෑමෙන් පසු නලුවාගේ දක්ෂතාව නිසා හෝ අන් නලුවකු නොමැති වීම නිසා නළුවා වෙනත් භූමිකා රඟපෑම. (........)

05. නෘත්ත යන්නට අදාළ නිවැරදි පිළිතුර කුමක් ද?
    1. නර්තනයන්හි තාලාන්විත බව හා දෘෂ්‍යරූපයෙහි සුන්දරත්වය දකගත හැක.
    2. රිද්මයානුකූල චලන සමග අත්, පා, ඇස්, මුහුණ මගින් භාව ප්‍රකාශ කරන නර්තනයකි.
    3. නෘත්තයෙහි රිද්මයක් ද, අර්ථයක් ද, මනෝභාවයක් ද ඇත.
    4. මෙහිදී අත්දැකීම් සමූහයක්, පාත්‍රයන් මාර්ගයෙන් ප්‍රේක්ෂක රස ජනනය උදෙසා ඉදිරිපත් කරයි.
    5. ආංගික හා සාත්වික අභිනයට අනුරූපව මනෝභාව ප්‍රකට කරයි. (........)

06. සංස්කෘත නාට්‍යයේ වාචික අභිනයේ දී භාවිත වන ප්‍රාකෘත ප්‍රභේදයට අයත් යුගලය තෝරන්න.

1. මාගධී, ශකාරී
2. ශෞරසේනී, අර්ධමාගධී
3. චාණ්ඩාල, ආවන්ති
4. ආභීරී, ප්‍රාච්‍යා
5. බාහ්ලීකා, ශාබරී (........)

07. නාට්‍ය අධ්‍යක්ෂක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. එංගලන්තයේ දී අධ්‍යක්ෂ (Director) ලෙසද අමරිකාවේ දී නිෂ්පාදක (Producer) ලෙස ද හැඳින්වේ.
2. චිත්‍රපට කලාවේ දී අධ්‍යක්ෂ යනු මුදල් ආයෝජකයා ය.
3. නූතන අධ්‍යක්ෂවරයා බිහිවන්නේ සැක්සේ මයිනිංගන් ආදිපාදවරයාගේ කාලයේ ය.
4. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ අධ්‍යක්ෂ භූමිකාව විදූෂක වෙත පැවරෙයි.
5. ග්‍රීක, රෝම හා ෂේක්ස්පියර් නාට්‍ය කවියා විසින්ම අධ්‍යක්ෂණය කෙරිණි. (........)

08. කෙටි නාට්‍ය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය කුමක් ද?

1. කෙටි නාට්‍ය එක් දර්ශනයකට හෝ ජවනිකාවකට පමණක් සීමා වේ.
2. එක් ගැටුම් අවස්ථාවක් පමණක් ගොඩනැගෙන ලෙස නිර්මිත රචනයක් විය යුතුය.
3. කෙටි නාට්‍ය පෙළක සංවාද ඉතාම වැදගත් ය.
4. පසුතල, රංගාලෝකය, සංගීතය වැනි ආනුෂංගික අංග යොදා ගැනීම කෙරේ වැඩි අවධානයක් යොමුකළ යුතුය.
5. ඉතා කුඩා අවකාශයක වුව ද රඟ දැක්විය හැකි නාට්‍යමය ක්‍රියාව ප්‍රබල වූ නිර්මාණයක් විය යුතුය. (........)

09. රටයකුම ශාන්තිකර්මයේ අපේක්ෂාව හා සමාන අරමුණක් සහිත අභිචාර කර්මයක් වනුයේ,

1. ව්‍යාධදේව වන්දනය ය.
2. මත්ස්‍ය රුවක් තනා දියට දැමීම ය.
3. ගසක පළමු අස්වැන්න බඩදරු මවකට දීම ය.
4. දරුවෙක් අතින් වඩාගෙන ධාන්‍ය සිටුවීම ය.
5. බාබාර් ආකිපෙලාගෝවෙහි සිදු කරන අනුකරණාත්මක ක්‍රමය ය. (........)

10. ගදුහ, නාගසේනහිමි හා දේව දූතයා යන චරිත පිළිවෙලින් ඇතුළත් බෞද්ධ පූජා කර්ම ත්‍රිත්වය නිවැරදිව තෝරන්න.

1. ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න
2. දොරකඩ අස්න, යුගාසන බණ, ආලවක දමනය
3. මිලින්ද ප්‍රශ්නය, යුගාසන බණ, දොරකඩ අස්න
4. දොරකඩ අස්න, මිලින්ද ප්‍රශ්නය, පිරිත් පිංකම
5. යුගාසන බණ, පිරිත් පිංකම, මිලින්ද ප්‍රශ්නය (........)

- **පහත තොරතුරු ගොනුව ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - මද්දලය | B - මීරුප්පේ | C - රොලීනා |
| D - විශ්වකර්ම | E - දුටුගැමුණු | F - බම්මන්නා |
| G - තානායම්පොළ | H - අලගනායිදු | I - තඹරාවිට |
| J - ඉන්දර්සභා | K - කයිසර් ජජීර් | L - වංගෙඩිය |
| M - මඩුව | N - විශ්වනාථ් ලව්ජි | O - ඇහැලේපොළ |
| P - විධුර | Q - පබ්ලික්හෝල් | R - මානාභරණ |

11. ලංකාවේ පැරණිතම ගැමි නාටකය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.
1. C H I 2. B I L 3. B F M 4. E L O 5. B C F (........)

12. වෙස්මුහුණු නාටකවලට අදාළ පිළිතුර සහිත වරණය කුමක් ද?
1. A I O 2. F H M 3. D G M 4. K M J 5. C D I (........)

13. නාඩගම් නාට්‍ය සම්ප්‍රදායට අදාළ පිළිතුර දක්වන්න.
1. A D H 2. E J M 3. F H N 4. E H P 5. A H O (........)

14. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
1. A D K 2. C H R 3. D G K 4. C J K 5. E H Q (........)

15. චාල්ස් ඩයස්ගේ නාට්‍ය ඇතුළත් වන්නේ කුමක් ද?
1. C H Q 2. E O Q 3. E P R 4. C N P 5. J K Q (........)

16. ජෝන් ද සිල්වා ශූරීන්ගේ නාට්‍ය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.
1. F N Q 2. J N R 3. H K R 4. N R Q 5. C J Q (........)

17. සන්නියකුම් යාගයෙහි කඩවත් තරණය නම් නාට්‍යමය ජවනිකාවේ භාවිත ප්‍රධානතම නාට්‍ය උපකරණය කුමක් ද?
1. කෙණ්ඩිය 2. කඩවත 3. දෙකොණ විලක්කුව
4. මුගුර 5. සන්නස් පත්‍රය (........)

18. රටයකුමේ දී භාවිත තොරණ් හයකින් යුත් රංගභූමිය හඳුන්වනු ලබන්නේ,
1. විදිය නමිනි 2. මල් මඩුව නමිනි 3. සබය නමිනි
4. යාග භූමිය නමිනි 5. සූනියම් විදිය නමිනි (........)

19. බෝවන රෝගවලින් ආරක්ෂාවීම හා එම රෝග පැතිරීම වැළැක්වීම සඳහා සත්පත්තිනි, වඳුරුමාල හා කුරුම්බර දේව සමූහයා උදෙසා සිදු කරන ශාන්තිකර්මය හඳුන්වන්නේ,
1. පූනා මඩුව ලෙසය. 2. ගම් මඩව ලෙසය. 3. ගී මඩුව ලෙසය.
4. පහන් මඩුව ලෙසය. 5. හැල්ලුම් මඩුව ලෙසය. (........)

20. කෝළම් රංග භූමියෙහි නළුවන් වේෂ නිරූපණයෙහි යෙදෙන ස්ථානය හැඳින්වූයේ,
1. මඩුව නමිනි 2. මල්පැල නමිනි 3. තානායම්පොළ නමිනි
4. වෙස් අත්ත නමිනි 5. පියස්ස නමිනි (........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා වරණ පහ බැගින් සපයා ඇත. ඒ අතරින් සෙසු පද හා නොගැළපෙන පදය තෝරා එහි අංකය වරහන තුළ යොදන්න.**

21. 1. ආරච්චි 2. මුදලි 3. ලෙංචිනා
4. ආඬිගුරු 5. තොංචි (........)

22. 1. තෙරුක්කූත්තු 2. හරිශ්චන්ද්‍ර 3. බලිවාලා
4. පිලිප්පු සිංඤෝ 5. දෙමළ බෙරය (........)

23. 1. ලංකා යක්ෂණී 2. රොඩී කෙල්ල 3. සිදේවි
4. ප්‍රතාප්සිං 5. උමතු විශ්වාසය (........)

24. 1. කොටළුවා 2. විජයතසම් 3. ජෙසලම්පුරය
4. කයාපාස් 5. ඔබේරඅමගවු (........)

25. 1. වෙල්ල කට්ටර 2. මන්මදන් 3. මාරි අම්මාන්
4. විදූෂක 5. තිරුවිලා (........)

26. නාටක අරංකන් කල්ලූරි ආයතනය පිහිටුවීමට මූලිකව කටයුතු කරන ලද්දේ,
1. එම්. ෂංමුගලිංගම් 2. එස්. මෞනගුරු 3. එස්. විද්‍යානන්දන්
4. චෝර්ණ ලිංගම් 5. කේ. කණපතිපිල්ලේ (........)

27. ජෙරොම් ද සිල්වා විසින් රංග වින්‍යාසය නිර්මාණය කළ නාට්‍ය යුගලය කුමක් ද?
1. ආයෙත් එන්නේ නෑ - මානස විල 2. මැක්බත් - ද ලයන් කිං
3. ට්‍රෝජන් කාන්තාවෝ - මානස විල 4. චෙක්පොයින්ට් - හැම්ලට්
5. වෙළෙන්දාගේ මරණය - මැක්බත් (........)

28. බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් කෘතිය ආශ්‍රයෙන්, ස්ටැනිස් ලව්ස්කිගේ රංග රීතිය අනුගමනය කොට ගුණසේන ගලප්පත්ති විසින් නිෂ්පාදිත නාට්‍ය වනුයේ,
1. සඳ කිඳුරු 2. දෑස නිසා 3. ලියතඹරා
4. තාත්තා 5. දේවතා එළි (........)

29. නාටකයක ලක්ෂණයක් ලෙසගත හැක්කේ,
1. කතා වස්තුව කවියාගේම නිර්මාණයක් වීම.
2. වස්තුව ප්‍රඛ්‍යාත වීම.
3. මධ්‍යම පාංතික හෝ ඊට පහත් සමාජ සිදුවීම් පාදක කොට ගැනීම.
4. නායක චරිතය ධීර ප්‍රශාන්ත ගණයට අයත්වීම.
5. අශ්වඝෝෂගේ, ශාරීපුත්‍ර ප්‍රකරණය නාටක ගණයට අයත්වීම. (........)

30. සංස්කෘත නාට්‍ය වස්තුවේ අර්බුදකාරී / අවස්ථාව හඳුන්වනු කෙසේද?
1. ප්‍රාරම්භ 2. යත්න 3. ප්‍රාප්ත්‍යාශ්‍යා
4. නියතාප්ති 5. ඵලාගම (........)

31. නෝ (NOH) නාට්‍ය කලාවේ ක්යෝ (KYO) ලෙස හඳුන්වන්නේ,
1. දෙවියා ය. 2. උමතු බව ය. 3. මිනිසා ය.
4. යක්ෂ ය. 5. ස්ත්‍රිය ය. (........)

32. ප්‍රධාන වීරයා දෙවියකු හෝ දෙවඟනක ලෙස නිරූපිත නෝ (NOH) නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
1. සුර නෝ 2. කශුර නෝ 3. කුරුයි නෝ
4. වකි නෝ 5. කිරි නෝ (........)

- **පහතින් සපයා ඇති ශිල්පීන්/ශිල්පිණියන්ගේ ඡායාරූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**



A




B



C



D



E

33. සිංහල වේදිකාවෙන් එතෙක් පැවති ඒකාකාරී බව මඟහැර ස්වභාවික නාට්‍ය සම්ප්‍රදායට අනුගතව නාට්‍ය නිර්මාණය කිරීමේ පුරෝගාමියා කවුද?

1. A  2. B  3. C  4. D  5. E  (........)

34. නූතන ඉංග්‍රීසි නාට්‍ය වේදිකාවේ අන්තර්ජාතික තලයට යමින්, පර්යේෂණාත්මක නාට්‍ය කලාවකට අවතීර්ණ වී සිටින නාට්‍ය වේදියා / වේදිණිය කවුරුන් ද?

1. A  2. B  3. C  4. D  5. E  (........)

35. ඔපෙරා ශෛලියෙන් නාට්‍ය නිෂ්පාදනය කිරීම ලංකාවට හඳුන්වා දුන් ශිල්පියකු/ශිල්පිණියක වන්නේ,

1. A  2. B  3. C  4. D  5. E  (........)

36. වාර්තා රංගය ප්‍රථම වරට දේශීය වේදිකාවට හඳුන්වාදුන් ශිල්පියා/ශිල්පිණිය වන්නේ කවුද?

1. A  2. B  3. C  4. D  5. E  (........)

37. දේශපාලන තේමා සහිත නාට්‍ය මෙන්ම ලාංකීය වේදිකාවේ ප්‍රථම වරට වැඩ වර්ජනයක් වේදිකාගත කළ නාට්‍ය ශිල්පියා/ශිල්පිණිය වන්නේ කවුරුන්ද?

1. A  2. B  3. C  4. D  5. E  (........)

38. "(සිනාසෙමින්) පපුව පුම්බවන තමන්ගේ තරුණ වයසට දොස් කියන්ඩ. මට මොකටද නිකං දොස් පවරන්නේ? "

ශාකුන්තලයේ එන ඉහත ප්‍රකාශය කියන ලද්දේ කවුරුන් විසින් ද?

1. අනසූයා  2. ප්‍රියංවදා  3. මේනකා
4. ශකුන්තලා  5. දුෂ්‍යන්ත  (........)

39. කුවේණි නාට්‍ය පෙළ රචනය සඳහා පාදකොට ගත් කෘතීන් ඇතුළත් වර්ණය තෝරන්න.

1. මහා වංශය, රාජාවලිය, කුවේණි අස්න
2. මහා භාරතය, කුවේණි අස්න, සිංහල ගැමි නාටකය
3. රාමායණය, මීඩියා, කුවේණි අස්න
4. කුවේණි අස්න, මහා භාරතය, සියබස් මල්දම
5. රාමායණය, කුවේණි අස්න, විශ්ණු පුරාණය  (........)

40. නාට්‍ය විචාරය යනු,

1. නාට්‍යයේ දුබලතා පෙන්වා දීමයි.
2. නාට්‍යයේ සාධනීය ලක්ෂණ ඉදිරිපත් කිරීමයි.
3. නාට්‍යයේ ගුණාත්මක බව සාකච්ඡා කිරීමයි.
4. නාට්‍ය නිර්මාණය විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරීමයි.
5. නාට්‍ය විවේචනය කිරීමයි.  (........)

## II කොටස

- A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

01. i. නාට්‍ය කලාව හැර ප්‍රාසංගික කලා ගණයෙහිලා සැලකිය හැකි වෙනත් කලා ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4)

 ii. ඉහත i හි ඔබ නම් කළ කලාංගයන් අතුරින් ප්‍රභේද දෙකක් ප්‍රාසංගික කලා ලෙස උදාහරණ සහිතව කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

 iii. නාට්‍ය කලාව ප්‍රාසංගික කලා ප්‍රභේද අතර සුවිශේෂ වීමට බලපාන හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

02. i. නාට්‍ය ශාස්ත්‍රයේ එන රූපක ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4)

 ii. ඉහත i හි දැක්වූ ප්‍රභේද අතුරින් එක් ප්‍රභේදයක ලක්ෂණ පහක් දක්වන්න. (ලකුණු 5)

 iii. අභිඥාන ශාකුන්තලය අයත් රූපක ප්‍රභේදය නම් කොට එම ප්‍රභේදයේ ලක්ෂණ නාට්‍ය පෙළ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

03. i. කුවේණි චරිතය තුළින් නාට්‍යකරු මතු කිරීමට උත්සහ ගන්නා උතුම් මානුෂීය ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 4)

 ii. කුවේණි අස්නෙහි ඇති මූලාශ්‍ර දෘෂ්ටියට වඩා නාට්‍යකරුගේ දෘෂ්ටියෙහි ඇති සුවිශේෂිතාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

 iii. "ලොවපුරා සැරිසරන්නේ විජය සහ කුවේණිලාය. ඔවුන් සොයන්නේ සෙනෙහස හා රැකවරණයයි." නාට්‍ය ඇසුරින් විමසන්න. (ලකුණු 6)

### B කොටස

04. i. කබුකි නාට්‍යයේ ආරම්භය සිදු වූ අයුරු කෙටියෙන් දක්වන්න. (ලකුණු 4)

 ii. කබුකි වේදිකාවේ කොටස් හඳුන්වා දෙන්න. (ලකුණු 5)

 iii. කබුකි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 6)

05. i. මනමේ නාට්‍ය වේදිකාගතවීමත් සමඟ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය සඳහා නාට්‍යකරුවන් භාවිත කළ විශේෂ ක්‍රමවේද අතුරින් විශේෂතා හතරක් දක්වන්න. (ලකුණු 2)

 ii. "වේදිකා නාට්‍ය පොදු ජනතාව අතරට ගෙනයාමේ විශාල කාර්යභාරයක් ඉටු කිරීමට 1974 වේදිකාගත කළ සුභ සහ යස නාට්‍ය දායක විය." කෙටියෙන් කරුණු දක්වන්න. (ලකුණු 5)

 iii. නූතන වේදිකා නාට්‍යයන්හි දක්නට ලැබෙන සාධනීය හා නිශේධනීය ලක්ෂණ නූතන නාට්‍ය උදාහරණ ලෙස ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 6)

06. i. ලංකාවේ නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)

 ii. ටීටර් හා මිනර්වා නාට්‍යවල ලක්ෂණ හතර බැගින් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 5)

 iii. නූර්ති නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ සඳහන් කර දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට එමගින් සිදු වූ මෙහෙය අගයන්න. (ලකුණු 6)

* *